# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 15 දරන
# වෛද්‍ය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 ජූලි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1996 අංක 15 දරන වෛද්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 44/95

**වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.**

1. මේ පනත 1996 අංක 15 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය ආඥාපනතේ 20 වන වගන්තිය, එම වගන්තියේ (5අ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 105 වන අධිකාරයේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(5ආ) 29 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනුඡේදය යටතේ වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකුගේම නම (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පවත්වා ගෙනයනු ලබන ලේඛනයේ වෙනම කොටසක ඇතුළත් කළ යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(iv) ඉහතින්ම වූ අනුඡේද යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් නොලැබූ—

(අඅ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම් ;

(ආආ) ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් යම් රටක යම් විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක

(i) ඒ විශ්ව විද්‍යාලයේ හෝ වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය අධ්‍යාපන ප්‍රමිති සැලකිල්ලට ගෙන, මේ වගන්තියේ කාර්ය සඳහා වෛද්‍ය සභාව විසින් පිළිගත්තා වූ ; හෝ

(ii) අදාල තැනැත්තා ඒ විශ්ව විද්‍යාලයට හෝ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් කර ගනු ලැබූ දින යේදී, මේ ආඥාපනත යටතේ වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හිමිකම් ගෙනදුන් උපාධියක් හෝ සුදුසු කමක් වූ වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් දරන යම් තැනැත් තකු වේ නම් ;

2—ඩී 039828—6,139 (96/03)

(ඇඇ) 1991 මැයි මස 17 වන දිනට පෙර සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට බැඳී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි, රජයේ වෛද්‍ය නිලධරයකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු පහක කාර්යක්ෂම සහ සතුටුදායක සමස්ත සේවා කාලයක් ඇති තැනැත්තකු වේ නම්; සහ

(ඇඇ) 32 වන වගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන්නකු වේ නම්.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.